**මාර්ග සංවර්ධන අධිකාරිය - 2016**

**-----------------------------------------------------------**

මාර්ග සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනතේ 16(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-------------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

**-------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**2.1 මතය ව්‍යාවනය**

**---------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන්, විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර) සමඟ අනුකූල වීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී. ලං. රා. ගි. ප්‍ර. 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

(i) ප්‍රමිතියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව, 2017 වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත් වලින් අයකර ගැනීමට අපේක්ෂිත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ප්‍රමාණය හඳුනාගෙන ජංගම වත්කම් ලෙස දැක්විය යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ග්‍රාමීය පාලම් ඉදිකිරීම් අංශය, ගෙවීම් අංශය සහ අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල සඳහා ලබාදුන් එකතුව රු. 42,608,398 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකරගත යුතු කාලපරිච්ඡේදය පිළිබඳ සැලකිල්ලට නොගෙන ජංගම නොවන වත්කම් ලෙස දක්වා තිබුණි.

(ii) අධිකාරියට සම්පූර්ණ අයිතිය ඇති පරිපාලිත සමාගම් වන මහ නැගුම රෝඩ් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉක්විප්මන්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්, මහ නැගුම කන්සල්ටන්සි ඇන්ඩ් ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සර්විසස් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඉමල්ෂන් ප්‍රඩක්ෂන් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම්වල විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සැලකිල්ලට ගෙන අධිකාරිය විසින් 2016 වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පියවර ගෙන නොතිබුණි.

(iii) වටිනාකම රු. 2,664,571,296 ක් සහ රු. 966,359,992 ක් වූ රඳවාගත් මුදල්, නිරවුල් කළයුතු දිනයන් හඳුනා නොගෙන ජංගම සහ ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර තිබුණි.

(iv) භාවිතයට සූදානම් තත්ත්වයේ නොමැති වටිනාකම රු. මිලියන 24.5 ක් වූ ගොඩනැගිලි සඳහා 2016 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1.2 ක් ක්ෂය කර තිබුණි. තවද, අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා පවතින මුළු ඉඩ ප්‍රමාණයෙන් වටිනාකම රු. මිලියන 496.5 ක් වූ වර්ග අඩි 72,400 ක් ස්ථිර පදනම මත රේඛීය අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන අතර එහි සම්පූර්ණ ක්ෂය ප්‍රමාණය ද අධිකාරියේ ක්ෂය වියදමක් ලෙසම දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිලි සඳහා රු. මිලියන 25ක් ක්ෂය කර තිබුණි.

**(ආ) ශ්‍රී. ලං. රා. ගි. ප්‍ර. 3 - ගිණුම් ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි.**

දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතියේ මාර්ග ඉදිකිරීම් වලට අදාළව කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවන ලද අගය විලම්භිත වියදම් ලෙස හඳුනාගෙන ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. ණය මුදලින් වර්ෂය තුළ ආපසු ගෙවන ප්‍රාග්ධන කොටස විලම්භිත වියදම් වලින් අඩුකර ප්‍රවර්තන වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට හර කර තිබුණි. කෙසේ වුවද, මෙම ගිණුම්කරණ පිළිවෙත සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී. ලං. රා. ගි. ප්‍ර. 7 - දේපළ, පිරියත හා උපකරණ**

(i) අවම වශයෙන් සෑම වාර්ෂික වාර්තාකරන දිනකදීම වත්කමක ධාරන අගය සහ ඵලදායී ජීවකාලය සමාලෝචනය කළයුතු වේ. කෙසේ වුවද, අධිකාරිය විසින් තවදුරටත් භාවිතා කරන මිලදී ගැනීමේ පිරිවැය රු. මිලියන 972 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල ඵලදායී ජීවකාලය සමාලෝචනය කිරීමට පියවර ගෙන නොතිබුණි. තවද. රු. මිලියන 1,592 ක් වූ වාහන 410 ක් 2017 ජනවාරි 01 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු බව නිරීක්ෂණය විය.කෙසේ වුවද, එම වත්කම්වල ඵලදායී ජීවකාලය නැවත තක්සේරු කර ප්‍රමිතියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව ගිණුම් තැබීමට පියවර ගෙන නොතිබුණි.

(ii) සාමාන්‍යයෙන් අධිකාරියේ වත්කම්, මිලදී ගත් දිනයේ සිට ඉවත් කරන දිනය දක්වා ක්ෂය සිදු නොකරයි. අධිකාරියේ වත්කම් අත්පත් කරගත් මාසයට පසු මාසයේ සිට ක්ෂය කරන අතර ඉවත් කරන මුළු මාසය සඳහාම ක්ෂය කරනු ලබන බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. තවද. මෙම ගිණුම්කරණ ක්‍රියාවලිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති සමඟ එකඟ නොවේ.

(iii) ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය මඟින් ලබාගත් රු. මිලියන 935.8 ක් වටිනා වත්කම්, වත්කම් වර්ගය අනුව වෙනම හඳුනා නොගෙන ගොඩනැගිලි ලෙස ගිණුම්ගතකර තිබුණි. එම නිසා ගොඩනැගිලිවල ක්ෂය ප්‍රමාණය රු. මිලියන 201 කින් අධිගණනය වී තිබුණි. තවද, දක්ෂිණ අධිවේගී ව්‍යාපෘතියේ රු. මිලියන 5,309 ක් වූ ප්‍රාග්ධන නොවන වියදම් ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් එහි ක්ෂය ප්‍රමාණයද රු. මිලියන 159.7 කින් අධිගණනය වී තිබුණි.

(iv) පිරිවැය රු. මිලියන 881.8 ක් වූ මෝටර් රථ 183 ක් රේඛීය අමාත්‍යාංශයේ සහ විවිධ ව්‍යාපෘතිවල භාවිතා කරනු ලබයි. කෙසේ වුවද, එහි ක්ෂය ප්‍රමාණය රු. මිලියන 154.6 ක් වූ අතර ශ්‍රී. ලං. රා. ගි .ප්‍ර. 01 සහ 07 ට පටහැනිව ආදායමට ලියහැර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විලම්භිත වියදම් සඳහා යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය මඟින් සිදුකළ මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා වැයකරන ලද රු. මිලියන 120,700 ක් වූ වියදම විලම්භිත වියදමක් ලෙස හඳුනාගෙන තිබුණු අතර රජයේ අයවැය ප්‍රතිපාදන මඟින් දරන ලද මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා සිදුකරන ලද වියදම පුනරුත්ථාපන වියදමක් ලෙස හඳුනාගෙන තිබුණි. සමාන වර්ගයේ වියදම් සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති 02 ක් අනුගමනය කිරීම විගණනයේ දී පිළිගත නොහැකි විය.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහාමාර්ග සහ අධිවේගී මාර්ග ඉදිකිරීම සහ නඩත්තු කිරීම අධිකාරියේ ප්‍රධාන කාර්යය වුවද, අධිකාරියට අයත් දිග කිලෝමීටර් 12,210 ක් වූ මහාමාර්ග වල වටිනාකම අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) අධිකාරිය ස්ථාපිත කිරීමේ සිට භාවිතා කරන ලද රටෙහි විවිධ ප්‍රදේශවල පවතින අධිකාරිය භාවිතයට ගන්නා ඉඩම් අක්කර 1,026.54 ක් වටිනාකම අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස හෝ හෙළිදරව් කර නොතිබුණි. තවද, වටිනාකම රු. මිලියන 67.6 ක් වූ අක්කර 03 පර්චස් 18 ක් සහිත තවත් ඉඩම් 04 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය මඟින් 2013 සිට 2015 වර්ෂවල ප්‍රසම්පාදනය කරන ලද රු. මිලියන 250.5 ක් වූ ජංගම නොවන වත්කම් සමාලෝචිත වර්ෂයේ දී පවා මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ස්ථාවර වත්කම්වල වටිනාකම එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබුණු අතර ඒ සඳහා ක්ෂය රු. මිලියන 51.05 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) අධිවේගී මාර්ග ඉදිකිරීමට සහ මාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමට අදාළව විදේශ ආධාර ව්‍යාපෘති 04 ක් මඟින් අධිකාරිය වෙත පවරන ලද රු. මිලියන 467.2 ක් වටිනා වත්කම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) පොළී ආදායම රු. මිලියන 466.13 ක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වෙන්කර පෙන්වා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා සංචලනය නොවන තොග ප්‍රතිපාදනය රු. මිලියන 32.14 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, නිවැරදි ප්‍රතිපාදනය රු. මිලියන 29.82 ක් පමණක් විය. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දිනට තොග ශේෂය රු. මිලියන 2.32 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) අධිකාරියට එරෙහිව සේවකයන් සහ බාහිර පාර්ශවයන් විසින් පවරා තිබුණු නඩු 41 කට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල පොදු සටහන් (General Notes) යටතේ රු. 338,547,170 ක මුදලක් 2016 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය බැරකම් ලෙස පෙන්වා තිබුණි. කෙසේ වුවත් සේවකයින් හා බාහිර පාර්ශවයන් විසින් අධිකාරියට එරෙහිව සත්‍ය වශයෙන් පවරා තිබුණු නඩු 170 ක් වූ අතර, නඩු 71 ට අදාළ රු. 550,413,600 කට වන්දි ඉල්ලුම් කර තිබුණි.

(ඌ) නුවර සහ බොරැල්ල උමං මාර්ගයේ පිහිටි වෙළඳ සංකීර්ණ 37 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(එ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ විගණනයෙන් ලද තොරතුරු අනුව, අධිකාරියේ සභාපති හෝ සාමාන්‍යාධිකාරි නමින් මෝටර් රථ 1754 ක් ලියාපදිංචි කර තිබුණි. කෙසේ වුවද, අධිකාරියේ මූල්‍ය අංශය මඟින් නඩත්තු කරන ස්ථාවර වත්කම් ලේඛනය අනුව අධිකාරියට අයත් මෝටර් රථ සංඛ්‍යාව 1486 කි. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය නමින් ලියාපදිංචි කරන ලද මෝටර් රථ 268 ක් අධිකාරියේ වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. මේ අතරතුර අධිකාරියේ වත්කම් ලේඛනයේ ඇතුළත් වාහන 205 ක් අධිකාරියේ නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. තවදුරටත් ඇතැම් මෝටර් රථ වත්කම් ලේඛනයේ දෙවරක් ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය. එම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. මිලියන 3,796 වූ මෝටර් රථ වටිනාකමේ නිවැරුදිතාවය පිළිබඳව විගණනයට සෑහීමකට පත් විය නොහැකි විය.

**2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්**

-----------------------------------

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන ලැබීම් හා ගෙවීම් සහ ඊට අදාළ මහනැගුම ඉමල්ෂන් ප්‍රඩක්ෂන් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් හා මහ නැගුම කන්සල්ටන්සි ඇන්ඩ් ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සර්විසස් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් අතර රු.මිලියන 86.7 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල මෝටර් රථවල පිරිවැය රු.මිලියන 3,363 ක් වෙනම වර්ගීකරණයක් කර ව්‍යාපෘති යටතේ දක්වා තිබුණි. කෙසේ වුවත්, මූල්‍ය ප්‍රකාශන වලට අදාළව විගණනය වෙත ලබා දී තිබුණු උපලේඛන අනුව වර්ෂය අවසානයේදී මෝටර් රථ පිරිවැය රු.මිලියන 3,451 ක් දක්වා තිබුණු අතර, රු.මිලියන 88 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනවූ ජාතික මාර්ග ආංශික ව්‍යාපෘතිය මඟින් අධිකාරිය වෙත පවරන ලද ගොඩනැගිලිවල වටිනාකම රු.මිලියන 2,481 කි. කෙසේ වුවත්, ඉහත ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල අදාළ ශේෂය රු. මිලියන 2,506 ක් ලෙස දක්වා තිබුණු නිසා රු. මිලියන 25 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව දක්ෂිණ අධිවේගී මාර්ගය ප්‍රාග්ධනිත වටිනාකම රු. මිලියන 116,357 සහ ඊට අදාළ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.මිලියන 116,797 ක් වූ නිසා රු.මිලියන 440 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘති යටතේ අධිකාරියේ ගිණුම්කරන පද්ධතිය අනුව 2016 දෙසැම්බර් 31 දිනට ලබාදී තිබූ ණයවලින් නොපියවන ලද ප්‍රමාණයට අදාළව වත්කම් එදිනට නිරූපනය කළ යුතුය. කෙසේ වුවත් 2016 දෙසැම්බර් 31 දිනට එම ශේෂ 02 අතර, රු. මිලියන 149.7 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------------

පහත සඳහන් කරුණු වලට අදාළව සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුනි. විස්තර පහත පරිදි වේ.

| | අයිතමය | වටිනාකම (රු.මිලියන) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | තොග අයිතම (උපකරණ, සෘජු සහ වක්‍ර අමුද්‍රව්‍ය, අමතර කොටස්, ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ අයිතමයන්) | 624 | විස්තරාත්මක උපලේඛන ලැයිස්තු හා ඒකක මිල |
| (ආ) | පරිපාලිතයන්ට ලබාදුන් මෝටර් රථ, පිරියත හා උපකරණ | සපයා නැත. | වත්කම් **සත්‍යාපන** වාර්තා |
| (ඇ) | වැඩ පූර්ව අත්තිකාරම් | 1,779 | කොන්ත්‍රාත් විස්තර |

**2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------------

අධිකාරිය විසින් රාජ්‍ය ආයතන වෙතින් අයවිය යුතු ශේෂයන් අයකර ගැනීම සඳහා කාලීන ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද බාහිර පාර්ශව සඳහා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම සඳහා ද ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ නිසා 2016 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ වශයෙන් රු.6,442,350,959 හා රු.3,585,727,582 ක දිගු කාලීන ශේෂයන් දක්නට ලැබුණි. විස්තර පහත වගුවෙහි දැක්වේ.

**(අ) ලැබිය යුතු ගිණුම්**

| | අයිතමය | මුදල (රු.) | විස්තරය | අයනොවූ කාලපරිච්ඡේදය / වර්ෂ |
|---|---|---|---|---|
| i. | ණයගැතියෝ | 1,248,930,524 | ණයගැති ගිණුම් - 12 | 2012 සිට 2015 දක්වා සහ 1987 සිට |
| ii. | කොන්ත්‍රාත් අත්තිකාරම් | 16,032,089 | කොන්ත්‍රාත්කරුවන් - 10 | වර්ෂ 05 කට වැඩි |

| | | | | |
|---|---|---|---|---|
| iii. | අනෙකුත් අත්තිකාරම් | 3,740,000,000 | උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය | වර්ෂ 02 කට වැඩි |
| iv. | වැඩ පූර්ව අත්තිකාරම් | 1,373,360,371 | බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය - සහ කොන්ත්‍රාත්කරුවන් 20 | වර්ෂ 03 – 04 සහ වර්ෂ 05 කට වැඩි. |
| v. | මිලදී ගැනුම් අත්තිකාරම් | 45,541,431 | සැපයුම්කරුවන් - 81 | වර්ෂ 01 - 02 අවුරුදු 03 - 04 සහ අවුරුදු 05 වැඩි |
| vi. | ලැබිය යුතු කුලී | 2,608,952 | බොරැල්ල සහ මහනුවර උමං මාර්ගවල සාප්පු හිමිකරුවන් 07 | වර්ෂ 02 – 04 සහ අවුරුදු 09 වැඩි |
| vii. | ණය කොන්දේසි (on – account) අත්තිකාරම් | 15,877,592 | මහ නැගුම මාර්ග ඉදිකිරීම් සහ යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම | වර්ෂ 03 - 04 |

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

| | අයිතම | මුදල (රු.) | විස්තරය | නිරවුල් නොකළ කාලපරිච්ඡේදය / |
|---|---|---|---|---|
| i. | සේවාදායක තැන්පතු | 205,588,213 | සේවාදායක වැඩ 148 | වර්ෂ 03 සිට 05 දක්වා සහ වර්ෂ 05 ට වැඩි |
| ii. | ප්‍රමාද ගාස්තු | 428,064,589 | කොන්ත්‍රාත්කරුවන් 344 | වර්ෂ 01 - 05 සහ වර්ෂ 05ට වැඩි |
| iii. | ආරක්ෂක තැන්පතු | 2,228,159 | කොන්ත්‍රාත් 109 | වර්ෂ 30 කට වැඩි |
| iv. | ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් | 2,949,846,621 | කොන්ත්‍රාත්කරුවන් 1248 | වර්ෂ 01 - 04 සහ වර්ෂ 05ට වැඩි |

## 2.3 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | | නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | **(i)** | මුදල් රෙගුලාසි 135(4) | අධිකාරියේ ගනන් දීමේ නිලධාරියා විසින් අධිකාරියේ ගනුදෙනු සඳහා බලය දීම අනුමැතිය හා සහතික කිරීම යන කාර්යයන් පැවරීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| | **(ii)** | මුදල් රෙගුලාසි 373 හා 2016 ඔක්තෝබර් 05 දිනැති අංක 346 දරන කාර්යාල චක්‍රලේඛය. | අධිකාරියේ උතුරු මැද පළාත් අධ්‍යක්ෂ කාර්යාලයට ලබා දී තිබුණු රු. 1,331,623 ක් වූ ඉන්ධන අග්‍රිමය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. |
| | **(iii)** | මුදල් රෙගුලාසි 770 | අධිකාරියේ වාර්ෂික වත්කම් සත්‍යාපනයේ දී භාවිතයට ගත නොහැකි වත්කම් හඳුනා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය.<br>මාර්ගෝපදේශ 9.4 | 2016 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක **PED**/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | |
| | **(i)** 9.4 වගන්තිය | චක්‍රලේඛයේ සඳහන් වගන්තිවලට පටහැනිව කාර්ය මණ්ඩලය 50 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත හා වෙනත් අමාත්‍යාංශ තුනක් වෙත මුදාහැර තිබුණි. |
| | **(ii)** 9.3.1 **(viii)** වගන්තිය | අධිකාරිය විසින් කළමනාකරණ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් **(succession plan)** පිළියෙල කර නොතිබුණි. |
| (ඈ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | 2016 ජූලි මස සිට 2017 මැයි මාසය දක්වා රු. 86,159,000 ක් වූ වෘත්තිය දීමනා අධිකාරියේ කාර්යමණ්ඩලයට ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ සහ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 531.11 ක බදු පූර්ව ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා රු. මිලියන 1,794.77 ක බදු පූර්ව ශුද්ධ අතිරික්තයක් වූ හෙයින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 1,263.66 ක අඩු වීමක් දැක්වුනි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ මෙම අඩුවීම සඳහා රු. 1,227.09 කින් වියදම් වැඩිවීම සහ රු. මිලියන 36.57 කින් මුළු ආදායම අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවීම්, රජයට බදු ගෙවීම්, සහ වර්ෂයේ ක්ෂය වියදම් සැලකිල්ලට ගැනීමේදී සමාලෝචිත වර්ෂයේ දී අධිකාරියේ අගය එකතු කිරීම රු. මිලියන 18,130 ක් වූ අතර, එය පසුගිය වර්ෂය සමඟ සැසඳීමේ දී එය සියයට 8.71 ක වැඩිවීමකි.

### 3.2. විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

#### 3.2.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

-------------------------------------

පසුගිය වර්ෂය සමඟ සැසඳීමේ දී 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කළ ඇතැම් වැදගත් ශේෂයන් පහත දැක්වේ

| විස්තරය | දෙසැම්බර් 31 දිනට 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| තොගය අඩුවීම. | 127,402,408 | 20,089,153 |
| ණයගැතියන් වැඩිවීම. | 461,097,831 | 909,964,628 |
| කලින්ගෙවීම් අඩුවීම. | 1,848,401 | 2,852,290 |
| තැන්පතු හා අත්තිකාරම් අඩුවීම. | 49,887,868 | 413,967,811 |
| වැඩ පූර්ව අත්තිකාරම් අඩුවීම. | 4,537,896,890 | 7,220,180,732 |
| වෙනත් ජංගම වත්කම් වැඩිවීම / (අඩුවීම) | 26,613,614 | (25,049,280) |
| අනෙකුත් ආයෝජන වැඩිවීම | 2,530,125 | 2,318,687 |
| දේශීය බැංකු ණය විලම්භිත වියදම් වැඩිවීම | 20,513,874,043 | 35,551,825,781 |
| වෙනත් ණය ගැනීම් - විලම්භිත වියදම් අඩුවීම. | - | 4,851,436 |
| සේවාදායක සහ අනෙකුත් තැන්පතු වැඩිවීම. | 553,027,946 | 195,790,930 |
| රඳවාගත් තැන්පතු අඩුවීම. | 2,630,221,255 | 276,000,007 |
| කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් (අඩුවීම) / වැඩිවීම. | 2,573,246,728 | (2,920,360,509) |
| ශුද්ධ මුදල් උත්පාදනය. | **(15,791,026,627)** | **(29,957,758,724)** |

සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය ඍණ කාරක ප්‍රාග්ධනය රු. 15,791,026,627 ක් උත්පාදනය කර ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, එය පසුගිය වර්ෂය සමඟ සැසඳීමේ දී සියයට 47 ක වැඩිවීමකි.

### 3.2.2 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබාගත් තොරතුරු අනුව අධිකාරියේ පසුගිය වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2016 ප්‍රතිශතය | 2015 ප්‍රතිශතය |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 0.70 | 0.96 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 0.68 | 0.93 |

සමාලෝචිත වර්ෂය අවසානයේ දී දේශීය බැංකු ණය සඳහා වූ පොළිය සහ ප්‍රාග්ධනය ආපසු ගෙවීම රු. මිලියන 5,961.14 ක් වීම මුළු ජංගම වගකීම් සියයට 32 කින් වැඩිවීමට හා එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය අඩුවීමට ප්‍රධාන හේතුවක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පසුගිය වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ භෞතික කාර්ය සාධනය සංයුක්ත සැලැස්මේ ඇතුළත් ප්‍රධාන කාර්ය සාධන නිර්ණායක සමඟ සැසඳීම පහත දැක්වේ.

| කාර්යය | | ප්‍රධාන කාර්යය සාධන නිර්ණායකය | මැනුම් ඒකකය | 2016 | | 2015 | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ඉලක්කය | සත්‍ය | ඉලක්කය | සත්‍ය |
| (අ) | ජාතික මහාමාර්ග නඩත්තුව | වැලි මුද්‍රිත සහ පෘෂ්ඨය පිළියම් කරන කිලෝමීටර් ප්‍රමාණය | කිලෝමීටර් | 900 | 652 | 800 | 273 |
| (ආ) | ජාතික මහාමාර්ග ජාලය | ජාත්‍යන්තර රළු බව පිළිබඳ දර්ශකය (**International Roughness Index >** 5.5) වැඩි ප්‍රතිශතයක් සහිත මාර්ග | | 60 | 38 | 46 | 46 |
| (ඇ) | මහාමාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම | ජාතික මාර්ග ජාලයේ ඇතුළත් දිග කිලෝමීටර් 4 ක් සහ 6 ක් වූ විථී. | කිලෝමීටර් | 191 | 209 | 225 | 203 |
| | | ජාතික මාර්ග ජාලයේ ඇතුළත් දිග කිලෝමීටර් 2 ක් වූ විථී. | කිලෝමීටර් | 6,500 | 7,000 | 7,000 | 7,000 |
| | | නිමකළ හා ක්‍රියාත්මක අධිවේගී මාර්ග දිග. | | 170 | 170 | 170 | 170 |
| (ඈ) | ඉදිකරන ලද අධිවේගී මාර්ග | අධිවේගී මාර්ග ජාල භාවිතයේ සාමාන්‍යය. | කිලෝමීටර් ගණන මිලියන දිනකට කිලෝමීටර් | 1.5 | 2.4 | 1.7 | 1.5 |

2016 වර්ෂය තුළ රළු මතුපිට සහිත මාර්ග ප්‍රමාණය අඩු කිරීමට අපේක්ෂා කළද, එම අඩුකරන ලද ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු 2017 අගෝස්තු 31 වන විට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙහි කාර්යසාධන නිර්නායකය සමාලෝචනය කිරීමට උපායමාර්ග තිබුණද, දත්ත ඇතුල් කිරීම යාවත්කාලීනව සිදු නොවීය. එම නිසා 2016 වර්ෂය තුළ අපේක්ෂිත ඉලක්ක ළඟා කරගත හැකිද , නොහැකිද යන්න සමාලෝචනය කිරීමට අධිකාරියට නොහැකි වූ බව නිරීක්ෂණය විය.

**4.1.1 ජාතික මාර්ග හා පාලම්වල නඩත්තු වැඩ**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ජාතික මාර්ග නඩත්තුව සඳහා 2016 වර්ෂයේ රජයේ ප්‍රතිපාදනය රු. මිලියන **4,000** ක් විය. ඉන් ලැබූ ප්‍රතිපාදන අගය රු. මිලියන 2,497 ක් වූ අතර, ඉදිරි වර්ෂය සඳහා ගෙවිය යුතු බිල්පත් සඳහා සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද වැඩ සඳහා ගෙවීම් කිරීමට මෙම මුදල් භාවිතා කර තිබුණි. ඊට අමතරව, 2016 වර්ෂය අවසානය වන විට වැඩ අවසන් කිරීම සඳහා රු. මිලියන 1,783 ක මුදලක් ගෙවිය යුතුය. එ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදනය සමඟ සැසඳීමේ දී ජාතික මාර්ග නඩත්තුව සඳහා දරන ලද මුළු වියදම රු. මිලියන 280 කින් ඉක්මවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ජාතික මාර්ග නඩත්තුව සඳහා වෙන් කළ ප්‍රතිපාදන මඟින් අධිකාරියට අයත් මාර්ගවල පමණක් නඩත්තු කටයුතු සිදුකල යුතුය. කෙසේ වෙතත් එම අරමුදල් භාවිතා කිරීමෙන් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ගවල නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු. මිලියන 232.92 ක් වියදම් කර තිබුණි.

(ඇ) මාර්ග නඩත්තු කටයුතු සඳහා මගනැගුම ඉමල්ෂන් සමාගමෙන් 2004 වර්ෂයේ සිට 2017 මාර්තු දක්වා රු. මිලියන 5,079.53 ක ඉමල්ෂන් මිළදී ගෙන තිබුණි. මහාමාර්ග ශාස්තු උපලේඛනයේ පිරිවැයට (**HSR**) ගැනුම් මිල තීරණය කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් බැහැරව ඉමල්ෂන් මිළදී ගැනීම සඳහා තීරණය කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 4.2 කොන්ත්‍රාත් පරිපාලනය

### 4.2.1 මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ) මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම**

**i.** 2016 වර්ෂය සඳහා මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම් කටයුතු සඳහා රජයේ ප්‍රතිපාදනය රු. මිලියන 8,065 ක් වූ අතර, ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 4,637.6 ක මුදලක් ලැබී තිබුණි. ඒ අනුව 2016 වර්ෂය ආරම්භයේ ගෙවිය යුතු බිල්පත්‍ර වටිනාකම ඇතුළුව 2016 වර්ෂය තුළ කළ වැඩ සඳහා ඉදිරිපත් කළ බිල්පත් වටිනාකම රු. මිලියන 6,378.2 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණයට වඩා රු. මිලියන 1,740.6 ක මුදලක් වැය වී තිබුණි.

**ii.** 2016 වර්ෂයේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන ප්‍රාදේශීය මාර්ග (**Non RDA Roads**) සඳහා කොන්ත්‍රාත් පිරිවැය රු. මිලියන 6,577.11 ක් වූ ගල් අතුරා තාර දැමීමේ ව්‍යාපෘති (**Metalling & Tarring**) 1081 ක් සිදු කිරීම ආරම්භ කර තිබුණු අතර, ඒ සඳහා 2016 වර්ෂය තුළ රු. මිලියන 331.87 ක් ගෙවා තිබුණි.

**iii.** මෙයට අමතරව මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන ප්‍රාදේශීය මාර්ග (**Non RDA Roads**) පුළුල් කිරීමේ හා වැඩිදියුණු කිරීම සඳහා 2016 වර්ෂයේ රු. මිලියන 1,868 ක් වැයකර තිබුණි. කෙසේ නමුත් මෙම ව්‍යාපෘති සඳහා සිදුකරනු ලබන වියදම් පියවා ගැනීම සඳහා භාණ්ඩාගාරය වෙතින් ප්‍රතිපාදන අනුමත කරවා ගෙන නොතිබුණු අතර, ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථමයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග පුළුල් කිරීමේ හා වැඩිදියුණු කිරීම් සඳහා ලබාගෙන තිබුණු ප්‍රතිපාදන මෙම ව්‍යාපෘති සඳහා යොදවා ගෙන තිබුණි.

**(ආ) දේශීය බැංකු විසින් මූල්‍යනය කෙරෙන ව්‍යාපෘති (LBFP)**

දිවයින පුරා කිලෝමීටර 1,433.85 ක දිගින් යුත් ප්‍රමුඛතා මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා දේශීය බැංකුවලින් රු.බිලියන 152 ක් වූ ණය මුදල් අධිකාරිය වෙත ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලය වෙතින් අධිකාරිය ලැබී තිබුණි. ඒ අනුව මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා රු.බිලියන 152 ක් වටිනා කොන්ත්‍රාත්, අධිකාරිය විසින් ලබාදී තිබුණි.

වර්ෂ 2012 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය තුළ දේශීය බැංකු 07 කින් එකතුව රු.මිලියන 143,513 ක් වූ ණය මුදල් අධිකාරිය විසින් ලබාගෙන තිබුණි. ඉන් රු.මිලියන 13,583 ක මුදලක් 2014, 2015 සහ 2016 වර්ෂ තුළදී නිරවුල් කර තිබුණි. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දිනට ණය මුදලේ ගෙවිය යුතු කොටස රු.මිලියන 129,930 ක් බව නිරීක්ෂණය විය. ලැබුණු ණය පිළිබඳ විස්තර හා සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ණය මුදල් කොටස පිළිබඳ විස්තර පහත දැක්වේ.

| බැංකුවේ නම | ණය ලැබීම් | | එකතුව | ප්‍රාග්ධනය ආපසු ගෙවීම් | | එකතුව | 2016 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ණය ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| | 2012 සිට 2015 දක්වා | 2016 | | 2015 | 2016 වර්ෂය තුල | | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| කොමර්ෂල් බැංකුව | **6,044** | 857 | **6,**901 | **489** | 392 | 881 | 6,020 |
| ලංකා බැංකුව | **30,348** | 3,572 | **33,920** | **1,687** | 2,465 | 4,152 | 29,768 |
| මහජන බැංකුව | **13,971** | 314 | **14,**285 | **1,827** | 1,218 | 3,045 | 11,240 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | **54,344** | 441 | **54,**785 | 339 | 2,710 | **3,**049 | 51,736 |
| සංවර්ධන මූල්‍ය සංස්ථාව | 1,210* | **82** | **1,292** | 45 | 108 | 153 | 1,139 |
| හැටන් නැෂනල් බැංකුව | **19,541** | 5,169 | 24,710 | 136 | 1,879 | 2,015 | 22,695 |
| ජාතික සංවර්ධන බැංකුව | **5,983** | 1,637 | 7,620 | - | 288 | 288 | 7,332 |
| **එකතුව** | **131,441** | **12,072** | **143,513** | **4,523** | **9,060** | **13,583** | **129,930** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** මාර්ග පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි ක්‍රියාකර නොතිබුණි. එක් එක් මාර්ගය සඳහා අවසන් කොන්ත්‍රාත් මිල තීරණය කිරීම, විශේෂයෙන් පත්කළ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක් **(SCAPC)** විසින් සිදුකර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය යෝජනා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිළිගත් ක්‍රමවේදයකට අනුව ඇගයීම් කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය යෝජනාවේ මිල රේටයන්, මහාමාර්ග ගාස්තු උපලේඛන පිරිවැයට **(HSR)** මිල රේටයන් සමඟ සැසඳීමේදී කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය යෝජනාවේ මිල රේටයන් සියයට 50 සිට සියයට 334 දක්වා ප්‍රමාණයකින් වැඩි වී තිබුණු අතර එක් එක් කොන්ත්‍රාත්වල මිල රේටයන්වල ප්‍රමාණාත්මක වෙනස්කම් නිරීක්ෂණය විය.

**(ii)** මෙම ව්‍යාපෘතියට අදාල මාර්ග 64 න් මාර්ග 28 ක් ඉදිකිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ ගිවිසුම් ගත වූ ණය මුදල රු.මිලියන 55,392 ක් විය. මෙම අනුමත ණය මුදලෙන් රු.මිලියන 21,239 ක් 2014 දෙසැම්බර් 31 දිනට මාර්ගවල කළවැඩ සහ අත්තිකාරම් වෙනුවෙන් ලබාදී තිබුණි. ඒ අනුව අනුමත ණය මුදලෙන් රු. මිලියන 34,153 ක්

තවදුරටත් ලබා ගැනීම සඳහා ඉතිරිව තිබුණි. මෙම ඉතිරි මුදලින් රු.මිලියන 28,000 ක් ණය ගිවිසුමට පටහැනිව වෙනත් කාර්යයන්ට යෙදවීම සඳහා 2014 දෙසැම්බර් වන විට ලබා ගෙන තිබුණි. එම නිසා ඉදිකිරීමට අදාළ වැඩ සඳහා රු. මිලියන 6,153.34 ක් පමණක් තිබුණි. ඉහත සඳහන් පරිදි රු. මිලියන 28,000 ක් ණය ගිවිසුමට පටහැනිව ලබාගෙන අධිකාරියේ මාර්ග ඉදිකිරීම් වැඩ සඳහා, ඉන්පසු වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ සහ විදේශ ආධාර මඟින් ක්‍රියාත්මක අනෙකුත් ව්‍යාපෘතිවල පරිපාලන වියදම් සහ අනෙකුත් කටයුතු සඳහා යොදාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම මාර්ගවලින් **බලාපොරොත්තු වූ කාර්ය සාධනය ළඟාකරගැනීමට නොහැකිවී තිබුණි. තවද** ව්‍යාපෘති 6 ක වැඩ 2017 සැප්තැම්බර් 30 දිනටත් නිමකර නොතිබුණි.

**(iii)** රු. මිලියන 28,000 අතිරේක වියදම් ආවරණය කිරීම සඳහා 2015, 2016 සහ 2017 වර්ෂ වල **අමාත්‍ය මණ්ඩල** අනුමැතිය සහිතව රු. මිලියන 5,400, රු. මිලියන 6,250 සහ රු. මිලියන 2,300 ක් වූ එකතුව රු. මිලියන 13,950 ක් භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණි. මේ අතරතුර, 2017 සිට 2019 වර්ෂ සඳහා මධ්‍යකාලීන අයවැය රාමුවක් මඟින් ඉතිරි රු. මිලියන 14,050 ක් ලබා ගැනීම සඳහා **අමාත්‍ය මණ්ඩල** අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද, මාර්ගවල ඉදිකිරීමට යෝජනා කළ සමහර අයිතමයන් වූ දිග සහ පළල, කොන්ක්‍රීට් කාණු පද්ධති, බොක්කු, පැතිබැම් සහ මාර්ගයේ මතුපිට ස්ථරයේ ඉදිකිරීම් යනාදී වැඩ කොටස් අඩුකර මාර්ගවල ඉදිකිරීම් කටයුතු සිදු කර තිබුණි.

**(ඇ) ත්‍රිකුණාමලය පිටත වටරවුම් මාර්ගය සම්පූර්ණ නොකිරීම**

මඩකලපුව - තිරික්කොන්ඩායි ආරු - ත්‍රිකුණාමලය (A - 15) සහ අබේපුස්ස - කුරුණෑගල - ත්‍රිකුණාමලය (A - 06) මාර්ග, ත්‍රිකුණාමලයෙන් පිටත සම්බන්ධවනසේ ඉදිකරන ලද පිටත වටරවුම් මාර්ගය සඳහා එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය යටතේ 2009 සහ 2010 වසරවලදී රු. මිලියන 3,495 ක් වැයකර පාලම් 08 ක් ඉදිකර තිබුණි. කෙසේ වුවද, 2017 සැප්තැම්බර් 30 දින වන විට වසර 06 ක් ගතවී ඇතත් මාර්ගය ඉදිකිරීම සඳහා අරමුදල් නොමැති වීම හේතුවෙන් මෙම පාලම් සම්බන්ධ කෙරෙන මාර්ග ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි.

**4.2.2 කතරගම සංචාරක නිවාසය ඉදිකිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කතරගම සංචාරක බංගලාවේ ඉදිකිරීම් කටයුතු 2004 වර්ෂයේදී මග නැගුම විසින් ආරම්භ කර තිබුණු අතර අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමට නොහැකිවීමේ ප්‍රතිඵලයක් ලෙස අතරමඟ අතහැර තිබුණි. ඉන් පසු ඍජු ශ්‍රමය යොදා නැවතත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, සංචාරක නිවාසයේ බිම් මහලේ කටයුතු බිත්ති මට්ටම දක්වා නිම කිරීමට හැකියාව ලැබුණි. පසුව බිම් මහලේ ඉදිකිරීම් වැඩ 2010 සැප්තැම්බර් 28 දින රු.12,352,242 කට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට පවරා තිබුණි. එම කොන්ත්‍රාත්කරුහට 2014 දෙසැම්බර් 31 දින වන විට රු.11,771,448 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු සමඟ එළඹි ගිවිසුම අනුව 2011 ජූනි 07 දින වැඩ නිම කළ යුතුව පැවතුණි. නමුත්, 2017 ජූනි වන විටත් වැඩ නිමකර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරු විසින් බිම් මහලේ සිදු කරන ලද වැඩවල සැලකිය යුතු අඩුපාඩු තිබුණ ද, එම අඩුපාඩු පිළිබඳ සැලකීමෙන් තොරව පළමු මහලේ ඉදිකිරීම් ද මෙම කොන්ත්‍රාත්කරුට රු.7,922,316 කට 2014 දෙසැම්බර් 24 දින පවරා තිබුණි.

(ඇ) කෙසේවුවද, අධිකාරිය විගණනය වෙත දන්වා සිටියේ පැරණි කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අයකර හා ඔහු වෙත ගෙවිය යුතු රඳවාගත් මුදල් භාවිතා කර අධිකාරියේ සෘජු කම්කරුවන් යොදවා ගෙන ඉතිරි වැඩ සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව වුවද, 2016 වර්ෂයේදී රු.මිලියන 12.7 ක කොන්ත්‍රාත් මිලකට වැඩ කොටස් වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට පවරා තිබුණි.

### 4.2.3 මැත්ගම - හාල්පොළ පාලම ඉදිකිරීම

--------------------------------------------

බ්‍රිතාන්‍ය යකඩ පාලම් ව්‍යාපෘතියේ අදියර I යටතේ රු. මිලියන 175.89 ක් වැයකර මැත්ගම - හාල්පොළ පාලම පුඩලුඔය හරහා ඉදිකිරීම් කටයුතු 2011 අගෝස්තු මස නිමකර තිබුණි. කෙසේ වුවද මෙම පාලම මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන පාරක පිහිටීම නිසා මෙම පාලම අදාළ ආයතනයට බාර දීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. පුඩලුඔය හරහා වාහන ගමන් කිරීමට අවම වශයෙන් පාලම් 02 ක් ඉදිකල යුතු වේ. ප්‍රධාන ඇල මාර්ගය හරස් කර එක් පාලමක් පමණක් ඉදිකිරීම නිසා මාර්ගය හරහා වාහන ගමන් කල නොහැකි වීම හේතුවෙන් මෙම පාලම සඳහා කළ ආයෝජනය නිෂ්ඵල වියදමක් බවට පත් වී ඇත.

### 4.2.4 මාබේරිතැන්න ගුවන් පථය ඉදිකිරීම

----------------------------------------------

මාර්ග සංවර්ධන අධිකාරියේ සෘජු ශ්‍රම දායකත්වය මඟින් දිගන වික්ටෝරියා මාර්ගයේ අභ්‍යන්තර ගුවන් පථයන් ඉදිකිරීමට යෝජනා වී තිබුණි.

මෙම කාර්යය සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 2,254.26 ක් වූ අතර ගුවන් පථයේ දිග හා පළල පිළිවෙලින් මීටර් 1200 ක් හා මීටර් 100 ක් විය. ඉදිකිරීම් කටයුතු 2013 අගෝස්තු 04 වන ආරම්භ කළ නමුත් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා දේශීය අරමුදල් වලින් රු.මිලියන 172.60 ක් ගෙවීමෙන් පසුව 2015 ජනවාරි 26 දින වන විට ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. අධිකාරියේ සැලසුම් අංශය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා මූලික සැලැස්මක් සකස් කර නොතිබූ බවත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම පරිසරියට සිදුවන බලපෑම පිළිබඳ තක්සේරු සහතිකය ලබා ගෙන නොමැති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.3 වත්කම් කළමනාකරණය

--------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අලුතින් ඉදිකරන ලද ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ලේ කාර්යාල කටයුතු 2015 අප්‍රේල් මස ආරම්භ කලද රු. මිලියන 108.2 වටිනා ස්ථාවර වත්කම් (ලී බඩු සහ උපකරණ) 2017 අගෝස්තු 31 දින වන විටත් ව්‍යාපෘතිය විසින් අධිකාරිය වෙත භාර දී නොතිබුණි.

(ආ) වටිනාකම රු. 29,820,700 ක් වූ උපයෝජනය නොකල හා සෙමින් චලනය වන අමතර කොටස් තොගය, 2012 වර්ෂයේ සිට භාවිතයට නොගෙන ගබඩාවේ රැඳී තිබුණි.

(ඇ) රු. 4,856,427 ක් වූ යල් පැනගිය නිල ඇඳුම්, සපත්තු හා සෙරෙප්පු, ටයර් හා ද්‍රව්‍ය තොගය - ඇසුපෝල්ට් පිරියත අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව 2008 වර්ෂයේ සිට ගබඩාවේ රැඳී තිබුණි.

(ඈ) සීමාසහිත ඉමල්ෂන් නිෂ්පාදන සමාගමේ මුල්‍ය ප්‍රකාශනවල ප්‍රකාශිත ප්‍රාග්ධනය, අධිකාරිය හා පුද්ගලික කොටස් හිමියෙකුට අයත් රු. 200 වටිනා කොටස් දෙකකින් සමන්විත වේ. රු. මිලියන 222.33 වටිනා වාහන, වැඩ අංගන, යන්ත්‍රෝපකරණ 2004 වර්ෂයේ සිට කුලී පදනම මත අධිකාරිය විසින් සමාගම වෙත ලබා දී තිබුණි. 2004 සිට 2012 ජනවාරි මාසය දක්වා වන

බදු ගිවිසුම විගණනය වෙත ඉදිරිපත් නොවුණි. මේ සම්බන්ධයෙන් අධිකාරිය හා සමාගම 2012 පෙබරවාරි 10 වන දින බදු ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වෙතත් 2017 ඔක්තෝබර් 31 දින වන විටත් අධිකාරිය විසින් වත්කම් නැවත අගය කිරීම සහ එහි කුලිය සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---------------------------------------

පරිපාලිත සමාගම් සමඟ අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද සමහර ගනුදෙනු මතභේදාත්මක විය. එම ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ) මග නැගුම සමාගම්**

------------------------

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම වෙත කුලියට දෙන ලද වාහන හා යන්ත්‍රෝපකරණ සහ අධිකාරිය විසින් ලබාදුන් වත්කම්, පරිභෝගික ද්‍රව්‍ය හා අමතර කොටස් වෙනුවෙන් 2004 සිට 2015 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ලැබිය යුතු කුලී ආදායම රු.222,391,330 ක් සහ අයවිය යුතු රු.63,276,545 ක් 2017 ජූලි 31 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
තවද, යථෝක්ත සමාගම වෙත පෙරමුසු මිලදී ගැනීම සඳහා 2013 සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ලබාදුන් අත්තිකාරම් රු.15,877,592 ක්, 2017 ජූලි 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**(ආ) පරිපාලිත සමාගම් වෙත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්**

-----------------------------------------------------------------------

2008 සිට 2016 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම වෙත රු.මිලියන 56,771.59 ක වටිනාකමකට මාර්ග ඉදිකිරීම් කොන්ත්‍රාත් 2,773 ක් සහ 2008 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය තුළ මග නැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගම වෙත රු.මිලියන 3,460 කට මාර්ග ඉදිකිරීම් කොන්ත්‍රාත් 109 ක් ප්‍රදානය කර තිබුණි. මුළු පිරිවැය ඇස්තමේන්තුවට සියයට 28 ක මිල ආන්තිකයක් එකතු කර කොන්ත්‍රාත් මිල තීරණය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(i)** ඉහත කොන්ත්‍රාත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා නොගෙන 2008 අගෝස්තු 01 දින ලබාදුන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පදනම් කර ගෙන ප්‍රදානය කර තිබුණි.

**(ii)** අධිකාරියේ සභාපතිගේ 2008 අගෝස්තු 01 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක: 1109/2008 හි ප්‍රතිපාදනයන් අනුව, අධිකාරිය විසින් මග නැගුම සමාගම් වෙත ලබා දෙන කොන්ත්‍රාත් බාහිර පාර්ශවයන් වෙත උප කොන්ත්‍රාත් ලෙස ලබා නොදිය යුතුය. කෙසේවුවද, මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමට ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් 2,773 න් කොන්ත්‍රාත් 2,521 ක් රු.මිලියන 48,981 ක් ගෙවමින් උප කොන්ත්‍රාත් මඟින් සිදුකර තිබුණි. තවද, මග නැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගමට ප්‍රදානය කරන ලද 109 ක් වූ සියලු කොන්ත්‍රාත් රු.මිලියන 3,460 ක් ගෙවමින් උප කොන්ත්‍රාත් මඟින් සිදුකර තිබුණි.

**4.5** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** **සේවක සංඛ්‍යාව**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(i)** **2017** ජුනි 30 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යා තත්ත්වය අනුව, තනතුරු 99 ක පුරප්පාඩු 746 ක් ද වෙනත් තනතුරු 14 ක අතිරික්ත 1,446 ක් ද පැවතුණි.

**(ii)** ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවයේ පුරප්පාඩු 6 ක්, තාක්ෂණික සේවාවල පුරප්පාඩු 156 ක් සහ ලිපිකරු හා සමාන්තර සේවාවල පුරප්පාඩු 33 ක් විගණනයේදී නිරීක්ෂණය විය. මෙම තත්ත්වය අධිකාරියේ කාර්යසාධනය කෙරෙහි අහිතකරව බලපා තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ)** **වෙනත් ආයතන සඳහා ලබාදුන් අධිකාරියේ සම්පත්**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් කිසිදු රාජ්‍ය ආයතනයක් වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසායයක් විසින් වියදම් දැරීම හෝ එහි සම්පත් යෙදවීම (මානව සම්පත් ඇතුළත්ව) සඳහා අවසර ලබා දී නොමැත. කෙසේ වුවද මෙයට පටහැනිව අධිකාරිය විසින් එහි කාර්ය මණ්ඩලයේ 47 දෙනෙකු උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශයට මුදා හැර තිබුණි. එම සේවකයන් වෙත සමාලෝචිත වර්ෂය තුළදී ගෙවන ලද වැටුප් හා අනිකුත් දීමනා රු. 40,594,078 ක් ප්‍රතිපූර්ණය කරවා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**4.6** **ප්‍රසම්පාදන අංශයේ කාර්යසාධනය**

මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදනයන් විධිමත් හා කාර්යක්ෂම ආකාරයෙන් සිදු කිරීමේ අරමුණ සහිතව ප්‍රසම්පාදන අංශය පිහිටුවා තිබුණි. කෙසේ වුවද, මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම්, පාලම් ඉදිකිරීමේ හා මාර්ග නඩත්තු කිරීමේ කටයුතු වලට අදාළ ඉතා වැදගත් ප්‍රසම්පාදන කටයුතු අධිකාරියේ වෙනත් අංශ මඟින් සිදුකර තිබුණි. එම නිසා, අධිකාරියේ ප්‍රසම්පාදන අංශය, අධිකාරියේ නොවැදගත් ඒකකයක් බවට පත් වී තිබුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1** **සංයුක්ත සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2003 ජුනි 02 දිනැති "යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මාර්ගෝපදේශ" අංක: පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 5.1.3 ඡේදයට අනුව, සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන කරන ලද පිටපත් එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 ට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද 2016 සිට 2020 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්ම 2016 පෙබරවාරි මස 29 දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. 2017 සිට 2021 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්ම 2017 නොවැම්බර් 30 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛය අනුව, එක් එක් අංශයේ මානව සම්පත් අවශ්‍යතාවයන් සංයුක්ත සැලැස්මේ අන්තර්ගත කළයුතු වේ. කෙසේ වුවද, තථ්‍ය අවශ්‍යතාවන් ඇගයීමකට ලක්කර මානව සම්පත් අවශ්‍යතාවන් පිළිබඳ විස්තර සංයුක්ත සැලැස්මට අන්තර්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

2016 වර්ෂය සඳහා අධිකාරියේ අභ්‍යන්තර විගණන වැඩසටහනට අනුව, මූල්‍ය සහ කළමනාකරණ විගණනයන් යටතේ පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලවල, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලවල සහ විධායක ඉංජිනේරු කාර්යාලවල විගණනයන් සිදු කිරීමට සැලසුම් කර තිබුණි. තවද, ප්‍රධාන ඉංජිනේරු - දිස්ත්‍රික්ක/ඇස්පෝල්ට්/කුඩු කරන යන්ත්‍ර/පෙරසවි අංගන, ප්‍රධාන ඉංජිනේරු - ව්‍යාපෘති, දේශීය බැංකු මඟින් මූල්‍යායනය කෙරෙහි මාර්ග ව්‍යාපෘති, ක්ෂේත්‍ර විගණනයන් යටතේ ඇතුළත් කර තිබුණි. කෙසේ වුවද, ඉඩම් අත්පත් කර ගැනීම, පද්ධති විගණනයන් සහ අධිකාරිය විසින් හිමිකාරිත්වය දරන මග නැගුම සමාගම්වල විගණනය, එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝට් සමාගම සහ ඉදිකිරීම් ව්‍යාපෘතිවල තාක්ෂණික විගණනයන් ආදී වැඩි අවදානමක් සහිත ක්ෂේත්‍රයන් අභ්‍යන්තර විගණනය මඟින් ආවරණය කර නොතිබුණි.

අභ්‍යන්තර විගණන අංශයේ අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 17 ක් සහ 12 ක් වූ අතර අභ්‍යන්තර විගණකවරුන් 02 ක්, තාක්ෂණික නිලධාරීන් 05 ක් සහ විගණන සහායකවරුන් 03 ක් සඳහා පුරප්පාඩු පැවති බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය අභ්‍යන්තර විගණන කාර්යයන්ගේ කාර්යක්ෂමතාව කෙරෙහි බලපා තිබුණි.

## 5.3 අයවැය පාලනය

2016 වර්ෂය සඳහා අයවැය ලේඛනය 2016 අගෝස්තු මස සංශෝධනය කර තිබුණු අතර ඒ සඳහා 2016 දෙසැම්බර් **21** දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණි. සුදුසු සහ ඵලදායී අයවැය පාලන ක්‍රමයක් නොමැති වීම හේතුවෙන් අධිකාරියේ සංශෝධිත අයවැය සහ තථ්‍ය ආදායම සහ වියදම අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. එම නිසා කළමනාකරණ පාලනයන් සඳහා ඵලදායී උපකරණයක් ලෙස අයවැය පාලනක්‍රමය උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.4 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විධානයන් සහ අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 පෙබරවාරි 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, මග නැගුම සමාගම්වල අයිතියෙන් වැඩි ප්‍රමාණයක් මහා භාණ්ඩාගාරයට හිමිවන පරිදි සහ ඉතිරිය මාර්ග සංවර්ධන අධිකාරියට ලැබෙන පරිදි සමාගම් 03 හි සාංගමික ව්‍යාවස්ථාවලින් සංශෝධනය කිරීමට තීරණය කර තිබුණි. කෙසේවුවද, එසේ කටයුතු කර නොතිබුණි. තවද, වගකිවයුතු අමාත්‍යාංශ විසින් ද මෙම තීරණය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ඉහත තීරණයට අතිරේකව, එම සමාගම්වලට අදාළව 2016 අගෝස්තු 10 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පහත විධානයන් ද 2017 නොවැම්බර් අග දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

**(i)** මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ සහ ඉමල්ෂන් නිෂ්පාදන සමාගමේ හිමිකාරිත්වය අධිකාරිය වෙත ලබා ගැනීම.

**(ii)** 2004 ජූනි 05 දින රු.1,000,000 බැගින් මග නැගුම ඉමල්ෂන් නිෂ්පාදන සමාගමෙහි සහ මග නැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගමෙහි සිදු කරන ලද තැන්පතු සඳහා කොටස් සහතික ලබා ගැනීම. 2017 නොවැම්බර් වන විටත් අදාළ කොටස් සහතික නිකුත් නොකළ ද අමාත්‍යාංශය හෝ අධිකාරිය විසින් මේ සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි.

**(iii)** අධිකාරිය විසින් සියයට 28 ක අලාභයක් දරමින් සමාගම් වලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සහ ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් කටයුතු වෙනුවෙන් අධිකාරිය සතු වත්කම් සමාගම්වලට භාවිතා කිරීමට ඉඩදීම සම්බන්ධයෙන් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයක් ගැනීම.

**6 පද්ධති හා පාලනයන්**

**---------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | | විගණන නිරීක්ෂණයන් |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමේ දුර්වලතා සහ ජංගම සහ ජංගම නොවන වත්කම් සහ වගකීම් වර්ගීකරණ දෝෂ |
| | | (ii) | සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගණුදෙනු හෙළිදරව් නොකිරීම. (මගනැගුම සමාගම් සහ එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් සමාගම සමඟ ගනුදෙනු). |
| | | (iii) | වත්කම් පැවරීම සහ අපහරණය කිරීම සම්බන්ධයෙන් ගිණුම්කරණ පිළියම්වල සහ වාර්තාකරන දිනට ශේෂ සඳහා විස්තරාත්මක උපලේඛන පිළියෙල කිරීම සම්බන්ධ දෝෂ. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) | අදහස් කරනු ලැබූ අරමුණු සඳහා ඵලදායි ලෙස අරමුදල් උපයෝජනය නොකිරීම, මූල්‍ය යෝජනා ඇගයීම, වැඩ නියෝග සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම, වැඩ සටහනට අනුව ඉදිකිරීම් වැඩ නිම කිරීම ආදී කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා. |
| | | (ii) | අදහස් කරනු ලැබූ අරමුණු සඳහා අරමුදල් උපයෝජනය නොකිරීම. |
| (ඇ) | තොග පාලනය | | යල්පැනගිය තොග අයිතමයන් අපහරණය. |
| (ඈ) | වත්කම් කළමනාකරණය | | ව්‍යාපෘති කළමනාකරණ ඒකක මඟින් අධිකාරිය වෙත වත්කම් භාරදීමේ ක්‍රමවේදවලට අදාළව හෙළිදරව් වූ දුර්වලතා. |
| (ඉ) | මානව සම්පත් කළමනාකරණය | (i) | අනුමත කරන ලද බඳවා ගැනීම් සහ උසස් කිරීමේ පරිපාටියක් නොමැතිවීම. |
| | | (ii) | බඳවා ගැනීම් සහ උසස් කිරීමේ ක්‍රමවේදවල අඩුපාඩු |
| (ඊ) | අරමුදල් උපයෝජනය | | ප්‍රතිපාදනය ඉක්මවා වියදම් දැරීම සහ දුර්වල අයවැය පාලනය |
| (උ) | ක්‍රියාකාරී සැලැස්ම | | ක්‍රියාකාරී සැලැස්මේ විෂය පථයෙන් පරිබාහිර මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග ඉදිකිරීම් වැඩ සිදු කිරීම. |
| (ඌ) | ව්‍යාපෘති කළමනාකරණය | (i) | ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාද |
| | | (ii) | වෙනත් කටයුතු සඳහා අරමුදල් උපයෝජනය |
| | | (iii) | කාල රාමුව ඇතුළත සැලසුම්ගත කටයුතු සිදු කිරීමට නොහැකිවීම. |